# උසස් පෙළ පන්ති කාමර සකස් කර ගැනීම හා ඉගෙනුම් ආධාරක පවත්වා ගැනීම සඳහා උපදෙස්

1. සෑම පන්ති කාමරයකම පිවිසුම් දොරටුවට ඉහලින් පන්තිය සහ පන්තිභාර ගුරුතුමියගේ නම සඳහන් පුවරුවක් බැගින් ප්‍රදර්ශනය විය යුතුය.
2. සෑම පන්ති කාමරයකම පාසලේ ආදර්ශ පාඨය, දැක්ම හා මෙහෙවර එකම පුවරුවක ප්‍රදර්ශනය විය යුතුය.
3. පන්ති කාමරය තුළ සතියේ කාලසටහන ප්‍රදර්ශනය කළ යුතුය.
4. පන්තියට එක් එක් විෂය උගන්වන ගුරුභවතාගේ නම සහ පන්ති නායක නායිකා දෙපලගේ නම් සඳහන් පුවරුවක් තිබිය යුතුය.
5. උසස් පෙළ බුදු මැදුරට මල් පූජාව සිදු කිරීම, බුද්ධ පූජාව පැවැත්වීම, කොඩි එසවීම යන පන්ති මට්ටමින් සිදු කළ යුතු කාර්යයන් සඳහා වාරය තුළ නියමිත දිනයයන් ප්‍රදර්ශනය කළ යුතුය.
6. දෛනිකව පන්තියේ විවිධ කාර්යයන් සිදු කිරීම සඳහා සතියේ දින 5 තුළ සිසුන් බෙදා එම සිසුන්ගේ නම් ප්‍රදර්ශනය කර තිබිය යුතුය. (එක් එක් දිනයට නම් කර ඇති සිසුන් විසින් එදින පන්තිය හා අවට පිරිසිදු කිරීම, ආගමික වතාවත්වලට අදාළ කටයුතු සිදු කිරීම හා අනිකුත් දෛනික කටයුතුවලට ගුරුවරුන්ට සහාය දීම සිදු කළ යුතුය.)
7. එක් එක් විෂය අනුව දෘෂ්‍යාධාර හා ඉගෙනුම් පරිසරයට අදාළ අයිතම ප්‍රදර්ශනය සඳහා පන්ති කාමරයේ පිටුපස බිත්තියෙහි කොටසක් ලී පට්ටම් යොදා වෙන්කර ගත යුතුය. එම වෙන්කළ කොටස තුළ එක් එක් විෂයට අදාළ රූපසටහන්, වගු / ප්‍රස්තාර, සමීකරණ ආදිය ප්‍රදර්ශනය කළ යුතු වේ. (බිත්තිවල ඇණ ගසා එම දෘෂ්‍යාධාර එල්ලීම / ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.)
8. සෑම ගුරු මේසයකටම ලා කොල පැහැති මේස රෙද්දක් දමා මල් සහිත බඳුනක් තබා තිබිය යුතුය. එම මල් බඳුන නිර්මාණශීලී ලෙස සකස් කරගත් එකක් වීම වඩාත් සුදුසුය. (මේස රෙද්දෙහි පන්තියේ නම සඳහන් කරන්න.)
9. පන්ති වාර්තා පොත සහ ශිෂ්‍ය නාම ලේඛනය ලා කොල පැහැති කවර දමා ඉටි කවර ආවරණ යොදා විධිමත්ව පවත්වා ගත යුතුය. පන්ති වාර්තා පොතෙහි මූලිකව සඳහන් කළ යුතු තොරතුරු සම්පූර්ණ වී තිබිය යුතුය.
10. සෑම පන්තියකම බුදු කුටිය විධිමත්ව හා පිරිසිදුව පවත්වා ගත යුතු අතර දිනපතා ආගමික වතාවත් ආරම්භයට පෙර බුදු කුටියට මල් පහන් පූජා කිරීම කළ යුතුය.
11. සෑම පන්තියකම වැඩකරන බිත්ති ඔරලෝසුවක් කළු / සුදු ලෑල්ලට ඉහලින් එල්ලා තිබිය යුතුය.
12. සෑම පන්තියකම ලෝක ගෝලයක් හෝ ලෝක සිතියමක් ප්‍රදර්ශනය කළ යුතුය.
13. සෑම පන්තියකම මූලික ඖෂධ ද්‍රව්‍යාවලින් සමන්විත කුඩා ප්‍රථමාධාර පෙට්ටියක් තිබිය යුතුය. එය යාවත්කාලීන කළ යුතුය.
14. සෑම පන්තියකම එක් එක් විෂයයන්ට අදාළව පැවරුම් හා කෙටි සටහන් බහාලිය හැකි පරිදි සකස් කරන ලද ෆෝල්ඩර අදාළ විෂයේ නම යොදා පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
15. පන්තියට ඇතුලු වන ස්ථානයේ දොරකඩ රබර් පාපිස්නාවක් පැවතිය යුතුය.
16. පන්තිය තුළ කොස්ස, ඉදල, කුණු කූඩය, කුණු එකතු කරන උපකරණය හා ජනෙල් දුහුවිලි පිසදා ගැනීමට අවශ්‍ය කොහු පිස්නා (Brushes) පවත්වා ගත යුතුය.
17. සෑම පන්තියක්ම පිරිසිදුව හා ආකර්ශනීය ලෙස පවත්වා ගැනීමට සියලුම සිසුන් කැපවීමෙන් කටයුතු කළ යුතුය.
18. සෑම සිසුවෙකුම පාසලෙන් ලබා දෙන අභ්‍යාස පොත් ප්‍රධාන විෂයයන් සඳහා භාවිත කළ යුතු අතර එම අභ්‍යාස පොත් ඉටි කවර ආවරණ යොදා පවත්වා ගත යුතුය. (පාසලෙන් ලබා දෙන අභ්‍යාස පොත් සඳහා වෙනත් කවර දැමීම අවශ්‍ය නොවේ.)
19. අභ්‍යාස පොත් පවත්වා ගැනිමට අදාළ උපදෙස් පත්‍රයක් මේ සමඟ ලබා දෙන බැවින් එහි උපදෙස් අනුව අභ්‍යාස පොත් පවත්වා ගත යුතුය.
20. සෑම සිසුවෙකුම ආහාර ගෙන ඒම සඳහා කෑම පෙට්ටිය භාවිත කළ යුතු අතර හැන්ද ද රැගෙන ආ යුතුය. (ඉදුල් සේදීම අවම කිරීම, ජලය අපතේ යාම අවම කිරීම හා කාලය ඉතිරි කිරීම සඳහා මෙම පියවර අනුගමනය කළ යුතු වේ.)